**යාපනය සහ කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - 2022**
--------------------------------------------------------------------------------

යාපනය සහ කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 පෙබරවාරි 08 දින එළඹි අංක 2710 - එස්ආර්අයි (සාමාන්‍ය මෙහෙයුම්) ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සහ අංක 2711 - එස්ආර්අයි (එස්එෆ්) (විශේෂ මෙහෙයුම්) ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සහ 2017 දෙසැම්බර් 15 දින එළඹි අංක 3603-එස්ආර්අයි හා අංක 3604-එස්ආර්අයි (අතිරේක මූල්‍යනය) ණය ගිවිසුමේ IV වන ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සැපයුම් හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, උතුරු පළාතේ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ උතුරු පළාතේ පළාත් පාලන ආයතන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘති ප්‍රදේශයේ නේවාසිකයන් සඳහා ජල සම්පාදන හා සනීපාරක්ෂක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ යාපනය අර්ධද්වීපයේ ජල සම්පත් ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම් අනුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන සංරචක යටතේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 16,474.59 කට සමාන එජඩො මිලියන 147.45 ක් විය. ඉන් රු.මිලියන 8,541.76 කට සමාන එජඩො මිලියන 76.45 ක් මූල්‍යනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණු අතර රු.මිලියන 5,363.04 කට සමාන එජඩො මිලියන 48 ක් මූල්‍යනය කිරීමට ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය (Agence Francaise de Development) එකඟ වී තිබුණි. ඉතිරි රු.මිලියන 2,569.79 කට සමාන එජඩො මිලියන 23 ශ්‍රී ලංකා රජය මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, ව්‍යාපෘතියේ ජල මූලාශ්‍රය වූ ඉරණමඩු වැව, මුහුදු ජලය පිරිපහදු කිරීමේ පිරියත ලෙස වෙනස් කොට සිදු කළ විෂය පථය ප්‍රතිව්‍යුහගත කිරීම් හේතුවෙන් ව්‍යාපෘතියේ ඇතැම් කටයුතු අත්හිටුවීමට සිදු වීම නිසා 2015 ඔක්තෝම්බර් 06 දින ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය ලබා දුන් ණය අවලංගු කරන ලදී. මේ නිසා, ආසියානු සංවර්ධන බැංකුව සමඟ ශ්‍රී ලංකා රජය 2017 දෙසැම්බර් 15 දින අතිරේක ණය ගිවිසුමකට එළඹී තිබුණි. අතිරේක ණය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘතියේ කටයුතු සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 23,256කට සමාන එජඩො මිලියන 153 කි. ඉන් රු.මිලියන 18,240 ට සමාන එජඩො මිලියන 120 ක් මූල්‍යනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි රු. මිලියන 5,016 කට සමාන එජඩො මිලියන 33 ශ්‍රී ලංකා රජය මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය 2011 පෙබරවාරි 15 දින ආරම්භ කරන ලද අතර එය 2017 අගෝස්තු 14 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, ව්‍යාපෘතිය කාලය 2026 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.1 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය හා සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය හා සම්බන්ධ පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතිය ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ දී විදේශ ණය ශේෂය රුපියල් මිලියන 19,412 ක් ලෙස දක්වා තිබුණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 21 ට අනුව 2022 දෙසැම්බර් 31 දිනට ඉහත ණය ශේෂයන් සඳහා රුපියල් මිලියන 15,544 ක සමානාත්මතා ගැළපීම් කළ යුතු වේ. කෙසේ වෙතත් 2016 පෙබරවාරි 04 දිනැති අංක AMP/16/0158/719/005 දරන කැබිනට් පත්‍රිකාවට අනුව ඉහත ණය මුදලින් සියයට 75 ක් ප්‍රදානයක් ලෙස සැලකිය හැකි බැවින් ඉතිරි සියයට 25 ක ණය ශේෂය සඳහා රුපියල් මිලියන 3,886 ක සමානාත්මතා ගැළපීම් සිදු කළ යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන තුළ ඊට අදාළ ගැළපීම් සිදු කර නොතිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය- LKAS 21 සමඟ අනුකූල වීමට ව්‍යාපෘතිය නිසැකවම කඩිනම් ක්‍රියාමාර්ග අනාගතයේදී ගනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. |
| 2.1.2 | 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් සම්බන්ධයෙන් ගෙවා තිබූ රුපියල් මිලියන 23.7 ක මුළු ආදාන වැට් බද්ද කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි. මෙම මුදල සමාලෝචිත වර්ෂයේදී පිළිවෙළින් කෙරීගෙන යන වැඩ සහ ලැබිය යුතු ගිණුම් වෙත වැරදි ලෙස බැර කිරීම හා හර කිරීම සිදු කර ඇත. ඒ අනුව, කෙරීගෙන යන වැඩ ගිණුමේ වටිනාකම සහ ලැබිය යුතු ගිණුමේ වටිනාකම පිළිවෙළින් එම වටිනාකමින් ඌන තක්සේරු හා අධි තක්සේරු කර තිබුණි. | ආදාන වැට් බදු හිමිකම් සඳහා ගිණුම්කරණ ගැලපුම් සම්බන්ධයෙන් ව්‍යාපෘතිය මූල්‍ය අංශයෙන් මගපෙන්වීමක් ඉල්ලා සිටි බව කරුණාවෙන් සලකන්න. ඒ අනුව ව්‍යාපෘති පොදු ලෙජරයේ ඇතුළත් වැට් බදු හිමිකම් ගැලපීමට මූල්‍ය අංශය උපදෙස් දී ඇත. | මෙම වැරදි ගිණුම් සටහන සංශෝධනය කර කෙරීගෙන යන වැඩ ගිණුමේ නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කළ යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘතියේ කාර්යයන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

| | ව්‍යාපෘති සංරචකය | විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | මුහුදු ජලය ප්‍රති ආශ්‍රිත පිරියත ඒකකය (Reverse Osmosis Desalination Plant) | 2021 පෙබරවාරි මස රු. මිලියන 14,559 ක් වූ නිර්මාණය කිරීම, ගොඩනැගීම සහ මෙහෙයුම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම හා ගිවිසුම් අත්සන් කිරීම සිදු කර තිබුණි. සැලසුම් කටයුතු 2021 මාර්තු ආරම්භ වූ අතර ව්‍යාපෘතිය 2023 සැප්තැම්බර් වන විට අවසන් කිරීමට අපේක්ෂා කරන ලදී. මෙහෙයුම් කාලය 2030 සැප්තැම්බර් දක්වා යාමට සැලසුම් | විවිධ හේතු නිසා කොන්ත්‍රාත්තුව ප්‍රමාද විය. කොන්ත්‍රාත්කරු විසින් 2024 මැයි දක්වා කාල දිගුවක් (EOT) ඉල්ලා ඇති අතර SWRO හි වර්තමාන භෞතික ප්‍රගතිය සියයට 62.18 කි, එම වැඩ නිම කිරීමට ව්‍යාපෘතිය (PMCIU) සමීපව අධීක්ෂණය කරයි. | සැලසුම් කළ පරිදි සංරචකය සම්පූර්ණ කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | කර ඇත. සමාලෝචිත වර්ෂය අවසානයේදී සියයට 83 ක භෞතික ප්‍රගතියක් ලබා ගැනීමට අපේක්ෂා කළද, 2022 දෙසැම්බර් 31 වන විට සත්‍ය භෞතික ප්‍රගතිය සියයට 49 කි. | | |
| (ආ) | යාපනය නගර ප්‍රදේශයේ ජල බෙදා හැරීමේ ජාලයේ නල එලීම. | වටිනාකම රු. මිලියන 3,160 ක් වන මෙම කොන්ත්‍රාත්තුව සැලසුම් කළ පරිදි 2023 ජනවාරි මාසයේදී සම්පූර්ණ කිරීමට අවශ්‍ය වූ අතර 2022 වසර අවසන් වන විට සියයට 95 ක ප්‍රගතියක් අපේක්ෂා කරන ලදී. කෙසේ වෙතත් එහි සත්‍ය භෞතික ප්‍රගතිය සියයට 56 කි. | කොන්ත්‍රාත් විෂය පථය අනුව ඉතිරි වැඩ නිම කිරීම සඳහා අමතර මුදලකට අනුමැතිය ලබා ගැනීම සඳහා අදාළ බලධාරීන් සමඟ සහ වැඩ නිම කිරීමට කොන්ත්‍රාත්කරු සමඟ ව්‍යාපෘතිය සමීපව අධීක්ෂණය කරයි. | ව්‍යාපෘතියේ මෙම සංරචකය සම්පූර්ණ කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | යාන්ත්‍රික, විදුලි සහ SCADA පැකේජය. | 2021 ඔක්තෝම්බර් මාසයේදී ලංසු ප්‍රකාශයට පත් කර ලංසු තැබීමේ ක්‍රියාවලිය 2022 මාර්තු මාසයේදී අවසන් කළද, 2022 දෙසැම්බර් 31 වන විටත් මූල්‍ය ඇගයීම් ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. | 2023 මැයි 15 දින පැවැත්වූ SCAPC රැස්වීමේදී කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා නිර්දේශ කිරීම සිදුකෙරුණි. ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා PMCIU සමීපව අධීක්ෂණය කරයි. | සංරචකය සම්පූර්ණ කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | නල එලීමේ කටයුතු වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලබාදී තිබූ රුපියල් මිලියන 72.6 ක නැවත ලබාගැනීමේ තැන්පතු මුදල ආපසු ලබා ගැනීම සිදුකර නොතිබූ අතර, DN 02 ජල බෙදා හැරීමේ නල පද්ධතියේ නල එලීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට නිකුත් කළ රුපියල් මිලියන 45ක කාර්ය සාධන බැඳුම්කරයේ වලංගු කාලය 2022 දෙසැම්බර් 3 දින කල් ඉකුත් වී මාස 5ක් ගතවී ඇතත් බැඳුම්කරයට අදාළ තැන්පත් කළ මුදල් ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) වෙතින් තැන්පතු ප්‍රතිපූරණය කරගැනීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMCIU) මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටී. | තැන්පතු මුදල් ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නියැදි විගණන පරීක්ෂාව අනුව අවස්ථා 09 කදී විචලන ගෙවීම් සඳහා වටිනාකම රුපියල් 140,002,634 ක් පූර්ව අනුමැතියකින් තොරව කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත්කරු සමඟ මුදල සඳහා එකඟතාවයන් අවසන් කළ පසු විචලන නියෝග කමිටුව විචලන නියෝග (VO) අනුමත පත්‍රයේ අත්සන් කිරීම සිදු කරනු ලබයි. ඒ නිසා එය ගෙවීමේ දිනයට වඩා වෙනස් විය හැක. | නීති රීති වලට අනුකූල විය යුතුය. |
| (ඇ) | උතුරු පළාතේ යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල වෙසෙන පවුල් ලක්ෂ තුනකට සුරක්ෂිත පානීය ජලය ලබාදීමටත් පවුල් 80,000 | මලාපවහන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට ජාතික ජල | මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ගේ අරමුණ ඉටු කිරීමට කටයුතු |

| | | |
|---|---|---|
| කට සනීපාරක්ෂක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමටත් මෙම ව්‍යාපෘතිය සැලසුම් කර තිබුණි. ව්‍යාපෘති විෂය පථය වරින් වර වෙනස් කර ඇති අතර ව්‍යාපෘති විෂය පථයෙන් මලාපවහන ජාලය සහ අපද්‍රව්‍ය පවිත්‍රාගාරය ඉවත් කරමින් ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කර තිබුණි. එබැවින්, අපේක්ෂිත කාර්යසාධනය ළඟා කර ගැනීමට නොහැකි වූ අතර, මෙම ව්‍යාපෘතියේ ප්‍රතිඵල ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ට අහිමි විය. | සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටී. | කළ යුතුයි. |

(ඇ) මුහුදු ජලය ප්‍රති ආශ්‍රිත පිරියත ඒකකය

| | | |
|---|---|---|
| (i) නිර්මාණය කිරීම, ගොඩනැගීම සහ මෙහෙයුම් කොන්ත්‍රාත්තුවට අදාල ගිවිසුම 2021 පෙබරවාරි 23 දින අත්සන් කරන ලද අතර 2021 ජනවාරි 25 දින රුපියල් මිලියන 14,559 කට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී. නිර්මාණ හා ඉදිකිරීම් සඳහා දින 910 ක් සහ මෙහෙයුම් සේවා සඳහා දින 2,555 ක් ඇතුළුව 2023 සැප්තැම්බර් වන විට කොන්ත්‍රාත්තුව අවසන් කළ යුතුය. 2022 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික ප්‍රගතිය සියයට 83ක් වූ නමුත් සැබෑ භෞතික ප්‍රගතිය සියයට 49.5ක් වූ බැවින් සැලසුම් කළ පරිදි කොන්ත්‍රාත් කාල රාමු තුළ ඉදිකිරීම් කටයුතු සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. තවද රු. මිලියන 4,799.6ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා ඇති අතර 2022 දෙසැම්බර් 31 දිනට මෙම කාර්යයේ මූල්‍ය ප්‍රගතිය සියයට 33ක් විය. | විවිධ හේතූන් මත කොන්ත්‍රාත්තුව ප්‍රමාද විය. SWRO හි වර්තමාන භෞතික ප්‍රගතිය සියයට 62.18කි, ව්‍යාපෘතිය (PMCIU) එකී වැඩ නිම කිරීම සඳහා සමීපව අධීක්ෂණය කරයි. 2017 අතිරේක ණය අත්සන් කිරීමේදී ණය කාලසීමාව අවසන් වන දිනය තුළ මෙහෙයුම් කාලය ද ඇතුළත් විය. නමුත් SWRO කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ ප්‍රමාදය හේතුවෙන්, මෙහෙයුම් කාලසීමාව ද ප්‍රමාද වීම සිදුව ඇත. එබැවින්, මෙහෙයුම් සේවා කාලය ආවරණය කිරීම සඳහා ණය අවසන් දිනය දීර්ඝ කිරීමට PMCIU කටයුතු කරනු ඇත. | සංරචකය සම්පූර්ණ කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) SWRO පිරියත ඒකකයට අදාලව තුළමුව සඳහා මුහුදු ජලය ලබාගන්නා නල මාර්ගය හා පිරිපහදු කිරීමෙන් පසු ඉතිරිවන ජලය පිට කිරීමේ නල මාර්ගය අක්වෙරල වැඩ (Offshore works) 2023 පෙබරවාරි 15 වන දින ආරම්භ කිරීමට සැලසුම්කර තිබූ නමුත් 2023 පෙබරවාරි මස වන විටත් ඊට අදාල කටයුතු ආරම්භ කර නොතිබුණි. | බොහෝ ප්‍රමාදයන් NWSDB පාලනයෙන් බැහැර ඒවා වේ. කෙසේ වෙතත් NWSDB වැඩ නිම කිරීමේ ප්‍රමාදය ආවරණය කර ගැනීම සඳහා අධීක්ෂණය කරනු ලබයි. | |
| (iii) කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, SWRO පිරියත ඒකකයේ මෙහෙයුම් හා නඩත්තු පිරිවැය සඳහා රු. 3,693,604,285 ක් අන්තර්ගතව පවතින අතර මෙහෙයුම් හා නඩත්තු කාලය 2024 වර්ෂයෙන් ආරම්භ වී 2030 වර්ෂයෙන් අවසන්වීමට නියමිතව පවතී. අතිරේක ණය ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව ණය කාල සීමාව 2026 ජූනි 30 දිනෙන් අවසන් වන බැවින් පවත්නා තත්ත්වයන් තුළ ණය | | |

| | | | |
|---|---|---|---|
| | කාලසීමාව ඇතුලතදී වසර 03 ක කාලයක් පමණක් මෙහෙයුම් හා නඩත්තු පිරිවැය ආවරණය කර ගත හැකි බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මූලික ණය ගිවිසුමෙන් ආවරණය නොවන කාලසීමාව සඳහා විශාල මෙහෙයුම් සහ නඩත්තු පිරිවැයක් සොයා ගැනීමට සිදු වන අතර, ඒ හේතුවෙන් ඒකකයේ ක්‍රියාකාරිත්වයේ තිරසාරභාවය සම්බන්ධයෙන් අවදානමක් පවතින බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | | |
| | (iv) SWRO පිරියත ඉදිකිරීම සඳහා ලංසු කැඳවීම 2016 දෙසැම්බර් 07 දින සිදු වුවද, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම 2022 ජනවාරි 25 වන දින සිදු වූ බැවින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා වසර පහක් ගත වී ඇත. | | |
| (ඉ) | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා විද්‍යුත් හා යාන්ත්‍රික උපකරණ සහ SCADA පද්ධතිය සවිකිරීම අවසන් කළ යුතු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කිරීමට සහ කොන්ත්‍රාත්තුව කඩිනමින් අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයක් ඇති අතර සහ එය ස්ථාවර කැබිනට් මණ්ඩලය පත් කළ ප්‍රසම්පාදන කමිටු සටහන්, ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාව, අභියාචනා ක්‍රියාවලි නිෂ්කාශනය, අමාත්‍ය මණ්ඩල සහ මණ්ඩල අනුමැතිය ලබා ගත් පසු ප්‍රදානය කරනු ලැබේ. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ඊ) | යාපනය නගර ප්‍රදේශයේ ජල බෙදා හැරීමේ පද්ධතිය ස්ථාපිත කිරීමට අදාලව වටිනාකම රු.මිලියන 3,160.20 ක් වූ කොන්ත්‍රාත්තුව 2021 ජනවාරි මස පෞද්ගලික කොන්ත්‍රාත් සමාගමක් වෙත ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත්තුව 2023 ජනවාරි වන විට අවසන් කළ යුතු වුවද, 2022 දෙසැම්බර් 31 වන විට කිලෝමීටර් 264න් අවසන් කර තිබුණේ කිලෝමීටර් 140 ක් පමණි. | කොන්ත්‍රාත්තුවේ විෂය පථය අනුව ඉතිරි වැඩ නිම කිරීම සඳහා අමතර මුදලකට අනුමැතිය ලබා ගැනීම සඳහා අදාළ බලධාරීන්ගෙන් අනුමැතිය ලබා ගැනීමට සහ කොන්ත්‍රාත්කරු සමඟ වැඩ නිම කිරීමට ව්‍යාපෘතිය සමීපව අධීක්ෂණය කරයි. | සංරචකය සම්පූර්ණ කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂය තුළ අග්‍රිම (Imprest) අරමුදල් ගිණුම් අංක 3604 යටතේ ව්‍යාපෘතිය භාවිතා කර ඇත්තේ අරමුදල් වලින් සියයට 46ක් පමණක් බවත්, 2022 දෙසැම්බර් 31 දින දක්වා පොලී වශයෙන් රුපියල් 69,087,080ක් ගෙවා ඇති බවත් අනාවරණය විය. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘතිය නිම කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශය, NWSDB සහ PMCIU සමීපව අධීක්ෂණය කරයි. | ප්‍රමාදයකින් තොරව අරමුදල් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 ඌන උපයෝජිත සම්පත්

| විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
| --- | --- | --- |
| රටේ පැවැති ආර්ථික අර්බුදයත් සමඟ බැඳීම් ගාස්තු ගෙවීම නොවැළැක්විය හැකි වුවද, ගෙවීම් ඉලක්ක සපුරා ගැනීමෙන් එය අවම කර ගත හැකිව තිබුණි. කෙසේ වෙතත් මහා භාණ්ඩාගාරය විසින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා උපයෝජනය නොකල ණය ශේෂය සඳහා බැඳීම් ගාස්තු ලෙස රුපියල් මිලියන 464.8 ක් ගෙවා තිබුණි. | ප්‍රධාන වශයෙන්, ව්‍යාපෘති විෂය පථය ප්‍රතිව්‍යුහගත කිරීම (සාම්ප්‍රදායික පිරිපහදු ක්‍රමවේදයේ සිට SWRO පිරිපහදු ක්‍රමවේදය දක්වා) ව්‍යාපෘතියේ ප්‍රගතියට සැලකිය යුතු ලෙස බලපෑවේය. කෝවිඩ් - 19, පාස්කු ප්‍රහාරය, අයහපත් කාලගුණික තත්ත්වයන්, රටේ ආර්ථික අර්බුද සහ රජය විසින් ආනයන සීමා කිරීම් වැනි හේතු නිසා ගිවිසුම් ප්‍රමාද විය. | වර්තමාන ආර්ථික තත්ත්වය හේතුවෙන් බැඳීම් ගාස්තු අඩු කිරීමට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ ආයතනය ණය නියෝජිතායතනය සමඟ සාකච්ඡා කළ යුතුය. |